**ISBN 978- 955-4563- 71- 1**

# 21 වෙනි සියවසට අනුකූල වනු පිණිස ජාතික පුස්තකාලය කෙසේ තම කාර්යයන් ඉටු කළ යුතුද?

**ඒ. පී. උදයංගනී ද සිල්වා**

**කැලණිය විශ්වවිද්‍යාල පුස්තකාලය, කැලණිය විශ්වවිද්‍යාලය**

මානවයා බුද්ධිමත් ව කටයුතු කිරීමට ආරම්භ කළේ යම් දිනක ද එදින සිට තොරතුරුවල අවශ්‍යතාවය මතුවන්නට ඇතැයි අනුමාන කළ හැකිය. වර්තමානය වනවිට මෙම තොරතුරු අවශ්‍යතා ඉතා සීඝ්‍රයෙන් ඉහළ ගොස් ඇත. මෙකී තොරතුරු අවශ්‍යතා සපුරා ගනු වස් මිනිසා විවිධ වූ ක්‍රමෝපායන් භාවිත කරනු දක්නට ලැබේ. එහි දී ප්‍රමුඛ ස්ථානයක් ලබා ගැනීමට පුස්තකාල සමත් වී ඇත. මිනිසාගේ බුද්ධිමය ක්‍රියාකාරකම් හා සිතුවිලි අනුසාරයෙන් නිර්මාණය වන්නා වූ දැනුම මෙන් ම තොරතුරු වාර්තාගත කොට වර්තමාන හා අනාගත පරපුර වෙනුවෙන් ආරක්‍ෂා කරමින්, විධිමත් ව සකස් කොට, ගබඩා කොට, තොරතුරු සොයන ඕනෑම අයෙකුට තොරතුරු සමුද්ධරණය කිරීමට මනා සංනිවේදනාත්මක ක්‍රමවේද භාවිතය තුළින් පවත්වා ගෙන යනු ලබන විධිමත් සංස්ථාවක් ලෙස පුස්තකාලය හැඳින්විය හැකිය. මෙලෙස නිර්මාණය වන්නා වූ පුස්තකාල වර්තමානයේ තොරතුරු පිපාසාවෙන් පෙළෙන පාඨක ජනයාගේ තොරතුරු මනදොළ සපුරනු වස් ඉතා භාර දූර්ය කාර්ය භාරයක් ඉටු කරනු ලබයි. එනම්,

- දැනුම හා වාර්තාගත තොරතුරු එක් රැස් කිරීම.
- දැනුම හා තොරතුරු සකස් කිරීම.
- දැනුම හා තොරතුරු විධිමත් ආකාරයෙන් සකස් කිරීම.
- තොරතුරු සමුද්ධරණය කිරීම.
- තොරතුරු හා දැනුම අනාගත පරපුරේ අවශ්‍යතා වෙනුවෙන් ආරක්‍ෂා කොට සංරක්‍ෂණය කිරීම.

යනා දී කාර්ය භාරයන් ඉටු කරනු ලබයි. පුස්තකාලය පිළිබඳ විවිධ නිර්වචනයන් ඉදිරිපත් වී ඇත. ඒවා මඟින් පුස්තකාලය පිළිබඳ පැහැදිලි පිළිබිඹුවක් ලබා දීමට සමත් වී ඇත. පුස්තකාලය සම්බන්ධයෙන් පහත දැක්වෙන නිර්වචන සලකා බැලීම ඉතා යෝග්‍ය යැයි හැඟේ.

**Library:** A collection of books and similar material organized and administered for reading, consultation and study. A room, a group of rooms, or a building in which a collection of books and similar material is organized and administered for reading, consultation and study.
(A. L. A. Glossary of library terms, 1943)

කියවීම, උපදේශනයට සහ අධ්‍යයන කටයුතු සඳහා පොත් හා ඒ සමාන ද්‍රව්‍ය එකතුවක් සංවිධානය කර අධීක්‍ෂණය කරන්නේ නම් එය පුස්තකාලයකි. එමෙන් ම කියවීම, උපදේශනයට සහ අධ්‍යයන කටයුතු සඳහා පොත් හා ඒ සමාන ද්‍රව්‍ය එකතුවක් සංවිධානය කර අධීක්‍ෂණය කරන කාමරයක්, කාමර සමූහයක් හෝ ගොඩනැගිල්ලක් පුස්තකාලයක් ලෙස හඳුන්වනු ලබයි.

**Library:** A collection of books and other literary material kept for reading, study and consultation.

A place, building, room or rooms set apart for the keeping and use of a collection of books etc.

(Harralds' Librarian Glossary, 1987)

කියවීමට, අධ්‍යයනයට හා උපදේශනය සඳහා පොත් හා අනෙකුත් සාහිත්‍ය එකතුන් තබා ඇති ස්ථානය පුස්තකාලය වේ. එසේ ම පොත් එකතු භාවිත කිරීමට වෙන් කොට තබා ඇති ස්ථානයක්, ගොඩනැගිල්ලක්, කාමරයක් හෝ කාමර සමූහයක් පුස්තකාලයක් වේ.

මෙලෙස නිර්මාණය වන්නා වූ පුස්තකාල අරමුණු හා පරමාර්ථ පදනම් කොට ගෙන විවිධ වූ පාඨක අවශ්‍යතා සපුරාලීම උදෙසා ක්‍රියාත්මක වනු දක්නට ලැබේ. මෙලෙස පාඨක අවශ්‍යතා උදෙසා ක්‍රියාත්මක වීමේ දී පොදුවේ සියලු ම පාඨකයින් එනම් සමස්ථ තොරතුරු පිපාසිත මානවයන් පිනවීමට එක් පුස්තකාලයකට නොහැකි වනු ඇත. එනිසා පාඨකයා කොට්ඨාශ වශයෙන් වෙන් කොට ගෙන, ඒ වෙනුවෙන් වූ අරමුණු හා පරමාර්ථ ගොඩ නඟා ගෙන පුස්තකාල වර්ග බිහි වී ඇත. ඒ අනුව වර්තමානය වනවිට පුස්තකාල වර්ග ගණනාවක් නිර්මාණය වී ඇති බැව් පෙනේ. එනම්,

ISBN 978- 955-4563- 71- 1

1. මහජන පුස්තකාල
2. ජාතික පුස්තකාල
3. ශාස්ත්‍රීය පුස්තකාල
    - පාසල් පුස්තකාල
    - කොලීජි පුස්තකාල
    - විශ්ව විද්‍යාල පුස්තකාල
4. විශේෂ පුස්තකාල
5. අතත්‍ය පුස්තකාල
6. සංඛ්‍යාංක පුස්තකාල

ලෙස පෙළ ගැස්විය හැක.

මෙම පුස්තකාලයන්ගේ අරමුණු මෙන් ම පාඨක ප්‍රජාව ද එකිනෙක වෙනස් ස්වරූපයක් ගනු ලබයි. මූලික ව මෙම පුස්තකාල වර්ගයන්ට ඉදිරිපත් වී ඇති නිර්වචන සලකා බැලීමෙන් ඒ බැව් සනාථ කර ගැනීමට අවස්ථා උදා වනු ඇත.

යම්කිසි නිශ්චිත භූමි ප්‍රදේශයකට සීමාව එනම් ප්‍රාදේශිය සභා, නගර සභා හා මහ නගර සභා යනා දී වශයෙන් වූ බල සීමාවකට යටත් ව, ජාති, ආගම්, කුල, තරාතිරම්, වයස් හෝ භාෂා භේදයකින් තොරව එකී සමාජයේ සියලු ම සාමාජිකයන්ට එනම් කුඩා ළමයාගේ පටන් මහල්ලා දක්වා වූ සියලු ම පාඨක ප්‍රජාවගේ තොරතුරු අවශ්‍යතා ඉටු කිරීම සඳහා නිර්මාණය වී ඇත්තා වූ පුස්තකාලය ලෙස මහජන පුස්තකාල හැඳින්විය හැකිය.

ඉගනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ මුල් බීජයන්ට එනම් ශිෂ්‍ය ප්‍රජාවටත්, අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයටත් යනා දී වශයෙන් වූ ත්‍රිපුද්ගල තොරතුරු අවශ්‍යතා ඉටු කරලනු වස් ශාස්ත්‍රීය පුස්තකාල නිර්මාණය කොට ඇති බැව් පෙනේ. මෙහි දී පාසල් පද්ධතියට අනුබද්ධ පුස්තකාලය පාසල් පුස්තකාලය ලෙසත්, කොලිජ් ආශ්‍රිත පුස්තකාල කොලිජී පුස්තකාල වන අතර විශ්වවිද්‍යාල පද්ධතියේ තොරතුරු අවශ්‍යතා ඉටු කරනුයේ විශ්වවිද්‍යාල පුස්තකාල මඟින් වේ.

එක් සුවිශේෂි විෂය ක්ෂේත්‍රයකට හෝ විෂය ක්ෂේත්‍ර පරාසයකට පමණක් සීමා වූ සම්පත් එකතුවක් ඇති, විශේෂඥ ක්ෂේත්‍රයක නියැලි ආයතනයක තොරතුරු අවශ්‍යතා සපුරාලීම සඳහා සංවිධානය වී ඇති පුස්තකාලය විශේෂ පුස්තකාල ලෙස හඳුන්වනු ලබයි.

පාඨකයාට අවශ්‍ය තොරතුරු, අවශ්‍ය වේලාවේ දී අවශ්‍ය ස්ථානයේ දී තොරතුරු නිෂ්පාදනය කිරීම සිදු කරන සේවා විශේෂයක් ලෙස සංඛ්‍යාංක පුස්තකාල හැඳින්විය හැකිය. පාඨකයාට සංනිවේදන ජාලයන් හරහා සංඛ්‍යාංක ස්වරූපයේ එකතුන්, රැස් කරන හා සංවිධානය කරන අතත්‍ය පුස්තකාලයක් ලෙස ද හැඳින්විය හැකිය.

ඉහත සාකච්ඡා කරන ලද සියලු ම වර්ගයේ පුස්තකාල අභිබවා යමින් ඉදිරියට පැමිණෙනුයේ රටක ජාතික පුස්තකාලයයි. ඒ මන්දයත් බොහෝ රටවල ජාතික පුස්තකාලයක් ලෙස පවතිනුයේ එක් පුස්තකාලයක් පමණක් වීමයි. එපමණක් නොව ජාතික පුස්තකාලය එරට ජාතියේ ඥාන කොෂ්ඨාගාරයයි. මූලික වශයෙන් රටකට ජාතික පුස්තකාලයක් අවශ්‍ය වනුයේ එරටෙහි බිහිවන සමස්ත ග්‍රන්ථ සම්භාරය හෝ ලේඛන උරුමය ඒකරාශි කොට අනාගත පරපුර වෙනුවෙන් එකී ලේඛන සම්භාරය ආරක්ෂා කර ගැනීමේ භාර්ය දූර්ය කාර්ය භාරය ඉටු කරගනු පිණිසය. මෙම ජාතික ලේඛන උරුමය ආරක්ෂා කර ගැනීමට අනෙකුත් පුස්තකාල ඉදිරිපත් නොවන්නේ මන්ද? එයට හේතු වනුයේ අනෙකුත් පුස්තකාල වර්ගයන් ක්‍රියාත්මක වනුයේ එකී පුස්තකාලයන්ට අනුබද්ධ මව් ආයතනයේ පාඨක ප්‍රජාවගේ තොරතුරු අවශ්‍යතාවයන් ඉටු කිරීම සඳහාය. එහි දී ග්‍රන්ථ ප්‍රතිග්‍රහණය, ඒවා සංවිධානය හා තොරතුරු සමුද්ධරණය යනා දී සියලු ම කටයුතු සිදු කරනුයේ පාඨක ප්‍රජාවට ආවේණික ලෙස වේ. මේ නිසා එම කාර්යයන්ට පරිබාහිර ව ජාතික උරුමය ගොඩ නඟා ගැනීමට එම පුස්තකාලයන්ට නොහැකි වේ. මෙම කරුණු පාදක කොට ගෙන රටක ජාතික පුස්තකාලය ජාතික ඥාන සම්භාරය එක් රැස් කිරීමේ හා ආරක්ෂා කිරීමේ වගකීම හා කාර්ය භාරය ඉටු කිරීමට නිර්මාණය කොට ඇත.

ජාතික පුස්තකාලය පිළිබඳ ව තව දුරටත් අවබෝධයක් ලබා ගැනීමට පහත නිර්වචනයන් සැලකිල්ලට ගත හැකිය. ජාතිය විසින් පවත්වා ගෙන යනු ලබන පුස්තකාලය ජාතික පුස්තකාලයක් වේ. සමස්ථ ජාතියට ම සේවය සපයන සහ රජයේ මුදලින් ක්‍රියාත්මක වන්නා වූ පුස්තකාලයක් ජාතික පුස්තකාලයකි. සාමාන්‍යයෙන් මෙවැනි පුස්තකාලවල ග්‍රන්ථ විමර්ශනය සඳහා පමණක් වේ. එසේ ම මෙම පුස්තකාල නීතිමය තැන්පතු පුස්තකාල වේ. මෙම පුස්තකාලයන්ගේ මූලික කාර්යය වනුයේ රටක ජාතික පුස්තකාලය එම රටෙහි බුද්ධිමය උරුමය වර්තමාන හා අනාගත පරම්පරාවන් වෙනුවෙන් ආරක්ෂා කිරීමේ මහඟු කර්තව්‍ය සඳහා උර දී ඇති ප්‍රධාන ජාතික ආයතනයකි. ජාතික පුස්තකාලයේ කාර්ය භාරය කෙසේ නිර්මාණය විය යුතු ද යන්න බොහෝ විද්වතුන් විවිධ මත පළ කොට ඇත. එලෙස දක්වන ලද විද්වත් මත කිහිපයක් පහත පරිදි පෙළ ගැස්විය හැකිය.

ISBN 978- 955-4563- 71- 1

ජාතියේ ලිඛිත සාහිත්‍ය එක්රැස් කිරීම, නීත්‍යානුකූල තැන්පතු ප්‍රකාශන ලබා ගැනීම, ජාතික ග්‍රන්ථ නාමාවලිය සම්පාදනය යන කාර්යයන් ජාතික පුස්තකාලයක මූලික කාර්යයන් වන අතර අන්තර් පුස්තකාල පිරුළු සේවය, අත් පිටපත් එක්රැස් කිරීම, පුස්තකාල ක්ෂේත්‍රයේ පර්යේෂණ පැවැත්වීම වැනි කාර්යයන් ජාතික පුස්තකාලයට ඉටු කළ හැකි කාර්යයන් වේ.
(ඊ. ඩබ්. හම්ප්‍රීස්)
ජාතියේ ලිඛිත සාහිත්‍ය එක්රැස් කිරීම හා ජාතික ග්‍රන්ථ නාමාවලිය සම්පාදනය ජාතික පුස්තකාලයේ මූලික කාර්යය වේ.
(හෙයින්ස් ගිට්ං)
කතික පුස්තකාලයේ කාර්යය වනුයේ වර්තමාන හා අනාගත පරම්පරාවන්ගේ ප්‍රයෝජනය සඳහා රට තුළ බිහිවන ග්‍රන්ථ සම්භාරය ඒකරාශි කොට සංරක්ෂණය කිරීමයි. (යුනෙස්කෝ)
ඉහත දක්වන ලද කාර්යයන් ජාතික පුස්තකාලයක් විසින් ඉටු කළ යුතුය යන්න දැක්වුව ද එහි බොහෝ කාර්රයන් එකිනෙකට සමාන බවක් උසුලනු ලබයි. එම කාර්රයන් වර්තමානය වනවිට බොහෝ පුස්තකාලවලින් ඉටු කරන බවක් ද දක්නට ලැබේ. කෙසේ නමුදු ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය ද ජාතික පුස්තකාලයක් ලෙස ඉටු කරනු ලබන කාර්යයන් ගණනාවක් හඳුනා ගැනීමට හැකිය. ඒවා පහත පරිදි පෙළ ගැස්විය හැකිය.

1. ශ්‍රී ලංකාවේ ප්‍රකාශිත හා අප්‍රකාශිත ලේඛන උරුමය ඒකරාශී කර ජාතික සංචිතයක් ගොඩ නැගීම හා සංරක්ෂණය කිරීම.
2. නීත්‍යානුකූල තැන්පතු පිටපත් ලබා ගැනීම.
3. ශ්‍රී ලංකාවට අදාළ විදේශීය ප්‍රකාශන ලබා ගැනීම.
4. ජාතික ග්‍රන්ථ විඥාපන සේවාවන් පවත්වා ගෙනයාම.
5. ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය සම්පාදනය
6. ජාතික ඒකාබද්ධ සුචිය සම්පාදනය
7. තොරතුරු ගවේෂණය පහසු කිරීම සඳහා ප්‍රලේඛන සේවා පවත්වා ගෙනයාම.
8. ජාතික හා ජාත්‍යන්තර පොත් හුවමාරු සේවා පවත්වා ගෙනයාම.
9. ශ්‍රී ලංකාවේ පුස්තකාල සඳහා තොරතුරු තාක්ෂණය උපයෝගී කරගැනීම සම්බන්ධයෙන් සහය වීම.

ඉහත දක්වන ලද කාර්යයන් ජාතික පුස්තකාලය ඉටු කරනු ලැබුව ද විවිධ වූ අභියෝග මධ්‍යයෙහි තම කාර්යයන් ඉතා සාර්ථක අන්දමින් ඉටු කිරීමට ජාතික පුස්තකාල අපොහොසත් වී ඇත. මේ නිසා ජාතික පුස්තකාලය 21 වන සියවසේ පාඨක අවශ්‍යතා හමුවේ වඩාත් දිරිමත් ව ශක්තිමත් සේවාවක් ඉටු කිරීමට කාලය එළඹ ඇත. එයට හේතු වනුයේ වර්තමානයේ අප ජීවත් වනුයේ 21 වන සියවසේ මුල් කාර්තුවේය. මේ වන විට ඉතා සීඝ්‍රයෙන් සමාජය තුළ තොරතුරු බිහිවන අතර ම ඒවා ඉතා ඉක්මනින් කල්පිරුණු ස්වභාවයකට පත් වේ. මේ නිසා පාඨකයින්ට ඉක්මනින් තොරතුරු මෙන් ම නිවරදි තොරතුරු පාඨක රුචි ස්වරූපයෙන් ලබා දීම ද සිදුවිය යුතුය. මේ නිසා 21 වන සියවසට අදාළ වන ආකාරයට ජාතික පුස්තකාලයේ කාර්යය භාරයන් ද වෙනස් විය යුතුව ඇත.
ඉහත වූ කාර්යයන් පදනම් කොට ගෙන ජාතික පුස්තකාලයක් ඉටු කළ යුතු කාර්යයන් පහත පරිදි පෙළ ගැස්විය හැකිය.

**1. ඕනෑම ස්වරූපයකින් ප්‍රකාශයට පත් වන්නා වූ තොරතුරු එනම් පොත්, පුවත්පත්, සඟරා, අත්පිටපත්, දුර්ලභ ප්‍රකාශන, සිතියම්, චිත්‍ර, මුද්‍රිත හෝ මුද්‍රිත නොවන ප්‍රකාශන, සංගීත කෘති, රූප, ඡායාරූප, ශ්‍රව්‍ය මාධ්‍ය, ශ්‍රව්‍ය - දෘශ්‍ය මාධ්‍ය යනා දී සියලු ම මාධ්‍යයෙන් නිර්මාණය වන්නා වූ ජාතික සාහිත්‍ය එක් රැස් කිරීම, සංවිධානය කිරීම හා සංරක්ෂණය කිරීම.**

රටක ප්‍රකාශයට පත් වන්නා වූ සියලු ම ප්‍රකාශන එරටෙහි උරුමයයි. එකී උරුමය ආරක්ෂා කරගෙන මතු පරපුරට ආරක්ෂා කර දීම ජාතික පුස්තකාලයේ වගකීමයි. එකී වගකීමට උර දෙනු වස් ජාතික පුස්තකාලය රටෙහි සමස්ථයක් ලෙස ප්‍රකාශයට පත් වන සියලු ම ප්‍රකාශනයන් ඕනෑ ම ස්වරූපයකින් එක් රැස් කොට ගෙන ආරක්ෂා කර ගැනීමට කටයුතු කළ යුතුය. විශාල රටක් නම් එකී රටෙහි ජාතික පුස්තකාලයට අනුබද්ධ ව ශාඛා තොරතුරු මධ්‍යස්ථාන පිහිටුවා අදාළ ප්‍රකාශන එක් රැස් කොට ප්‍රධාන ජාතික පුස්තකාලයේ තැන්පත් කිරීමට සමත් විය යුතුය.

**2. ඕනෑම ස්වරූපයකින් ප්‍රකාශයට පත් වන්නා වූ තොරතුරු එනම් පොත්, පුවත්පත්, සඟරා, අත්පිටපත්, දුර්ලභ ප්‍රකාශන, සිතියම්, චිත්‍ර, මුද්‍රිත හෝ මුද්‍රිත නොවන ප්‍රකාශන, සංගීත කෘති, රූප, ඡායාරූප, ශ්‍රව්‍ය මාධ්‍ය, ශ්‍රව්‍ය - දෘශ්‍ය මාධ්‍ය යනා දී සියලු ම මාධ්‍යයෙන් නිර්මාණය වන්නා වූ දේශීය සාහිත්‍ය එක් රැස් කිරීම, සංවිධානය කිරීම හා සංරක්ෂණය කිරීම.**

ජාතික පුස්තකාලයක් ක්‍රියාත්මක වනුයේ එරටෙහි රජය මැදිහත් වීම තුළිනි. ඒනිසා මූල්‍ය ප්‍රතිපාදන ලබා ගැනීම ද එතරම් අපහසු කටයුත්තක් නොවේ. මෙහි දී මූලික ව විදේශයන්හි දී දේශීය කතුවරුන් රචිත තොරතුරු මූලාශ්‍ර මෙන් ම විදේශ භාෂාවලින් බිහිවන දේශීය තොරතුරු අන්තර්ගත තොරතුරු මූලාශ්‍ර ද අයත් කර ගැනීමට ජාතික පුස්තකාලය සමත් විය යුතුය. තව ද රටක විදේශීය

ISBN 978- 955-4563- 71- 1

කෘති මිල දී ගැනීමට නොහැකි පුස්තකාල තිබිය හැක. එයට හේතු වනුයේ මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීමේ ගැටලුවයි. මේ නිසා ජාතික පුස්තකාලයේ වගකීම වනුයේ එලෙස අනෙකුත් පුස්තකාලයන්ට අත්පත් කර ගැනීමට නොහැකි විදේශීය සාහිත්‍ය ද එක් රැස් කොට, පර්යේෂකයින්ගේ අවශ්‍යතා සඳහා ලබා දීමයි.

**3. රටක සංස්කෘතික හා බුද්ධිමය උරුමය එකතු කිරීම, ආරක්ෂා කිරීම හා ඒවා ප්‍රදර්ශනය කිරීම.**

ඕනෑ ම රටක තම රටට ආවේණික වූ සංස්කෘතියක් මෙන් ම සංස්කෘතික උරුමයක් ද ඇත. එකී උරුමය ආරක්ෂා කොට ගෙන අනාගත පරපුරට දැක බලා ගැනීමට හැකි වන ආකරයට ආරක්ෂා කොට ප්‍රදර්ශනය කිරීම ද ඉතා යෝග්‍ය වේ. එම කර්තව්‍ය භාර ගෙන කටයුතු කරනුයේ ජාතික පුස්තකාලයයි. ජාතික පුස්තකාලය මඟින් තම රටට ආවේණික වූ සංස්කෘතික උරුමයන් පිළිබඳ ගවේෂණය කොට ඒ පිළිබඳ සොයා බලා ඒවා එක් රැස් කොට පවත්වා ගෙන යාමට සමත් විය යුතුය.

**4. ඕනෑම ආකාරයක තොරතුරු වෙත පාඨක ප්‍රවේශය සැලසීම.**

ජාතික පුස්තකාලය විසින් විවිධ වූ ස්වරූපයන්ගෙන් ජාතික සාහිත්‍ය මෙන් ම විදේශ සාහිත්‍ය ද ඒක රාශි කරනු ලබයි. එහි දී මෙලෙස විශාල වශයෙන් රැස් කරගන්නා වූ තොරතුරු අවශ්‍යතා පාඨකයාට අවශ්‍ය තොරතුරු, අවශ්‍ය මොහොතේ, අවශ්‍ය ස්වරූපයෙන් සපයා දීමට ජාතික පුස්තකාලය සමත් විය යුතුය. පාඨකයාට ඕනෑම ආකාරයේ තොරතුරක් වෙත ඉක්මනින් හා පහසුවෙන් ප්‍රවේශ විය හැකි පරිදි පුස්තකාල සූචි, දත්ත පදනම් මෙන් ම අනුක්‍රමණිකා, ග්‍රන්ථ නාමාවලී වැනි ප්‍රවේශන මෙවලම් ද නිර්මාණය කොට තැබීම ජාතික පුස්තකාලය සතු ප්‍රධාන කාර්ය භාරයක් ලෙස හඳුනාගත හැකිය.

**5. රටක සමස්ථ පුස්තකාල පද්ධතියටම ජාතික පුස්තකාලය නායකයා ලෙස කටයුතු කිරීම.**

සෑම රටක් තුළ ම මහජන පුස්තකාල, පාසල් පුස්තකාල, විශේෂ පුස්තකාල, විශ්වවිද්‍යාල පුස්තකාල, කොලිජ් පුස්තකාල යනා දී වශයෙන් පුස්තකාල රාශියක් ස්ථාපිත ව ඇත. එම පුස්තකාලයන් බොහෝවිට ක්‍රියාත්මක වනුයේ තම මව් ආයතනයේ පාඨක අවශ්‍යතාවයන් සපථ කිරීමේ අරමුණු පෙරදැරිවය. එනිසා අනෙකුත් පුස්තකාලයන් සමඟ විධිමත් ව සම්බන්ධ වෙමින්, එකී පුස්තකාලයන්ට මූල්‍යමය ගැටලු පවතින විට ඒකාබද්ධ ව තොරතුරු මූලාශ්‍ර ප්‍රතිග්‍රහනය කිරීම, තොරතුරු මූලාශ්‍ර හුවමාරු කර ගැනීම යනා දී කාර්යයන් වලදී ජාතික පුස්තකාලය නායකත්වය ගෙන කටයුතු කළ යුතුවේ. එසේ ම ජාතියක් වශයෙන් එක් ව ප්‍රකාශන සුලභතාවය ඇති කිරීම සඳහා ඒකාබද්ධ සූචිය මෙන් ම මධ්‍යගත සූචි නිර්මාණය කොට පවත්වා ගෙන යාම ද ඉතා වැදගත් වේ. එලෙසම පුස්තකාල ද්‍රව්‍ය සංරක්ෂණය හා ප්‍රතිෂ්ඨාපනය සම්බන්ධයෙන් සියලු ම පුස්තකාලවලට ප්‍රධානත්වය දිය යුතු ආයතනය වනුයේ ජාතික පුස්තකාලයයි. ජාතික මට්ටමේ දී පුස්තකාලයන්ගේ ස්වභාවය හා ඒවායෙහි ක්‍රියාකාරීත්වය පදනම් කොටගෙන පුස්තකාල ශ්‍රේණිගත කිරීම් සිදු කරනුයේ ද සිදු කළ යුත්තේ ද ජාතික පුස්තකාලය මඟිනි. පුස්තකාල ගොඩනැගිලි සැලසුම්කරණය, අභ්‍යන්තර අංශ සංවිධානය, පුස්තකාල ද්‍රව්‍ය ප්‍රතිග්‍රහණය හා සංරක්ෂණය යනාදී වශයෙන් වූ විවිධ උපදේශන කටයුතු ද ජාතික පුස්තකාලය මඟින් ඉටු කළ යුතු කාර්ය භාරයක් ලෙස හඳුනාගත හැකිය. මෙලෙස සියලු ම කටයුතු වලින් අවධාරණය වනුයේ ජාතික පුස්තකාලයක් සමස්ථ ජාතික පුස්තකාල පද්ධතියට ම ප්‍රබල නායකත්වයක් සැපයිය යුතු බවය.

**6. ජාතික හා ජාත්‍යන්තර ග්‍රන්ථ විඥාපන පාලනයට සහය දැක්වීම.**

ග්‍රන්ථ විඥාපන පාලනය යන්න සරළ ව දක්වන්නේ නම් මිනිසා දැනුමට අනුකූල ව නිර්මාණය වන්නාවූ සමස්ථ තොරතුරු මූලාශ්‍රයන් පිළිබඳ ලිඛිත වාර්තාවන් තබා ගැනීම ලෙස වේ. ග්‍රන්ථ විඥාපන පාලනය මූලික වශයෙන් කොටස් 2කට බෙදා දැක්විය හැකි වේ.

1. ජාතික ග්‍රන්ථ විඥාපන පාලනය
2. විශ්ව (ජාත්‍යන්තර) ග්‍රන්ථ විඥාපන පාලනය

ලෙස වේ.

යම්කිසි නිශ්චිත භූමි ප්‍රදේශයක් තුළ විවිධ මාධ්‍යයන්ගෙන් ප්‍රකාශයට පත් වන්නා වූ බිහි වන්නා වූ තොරතුරු මූලාශ්‍රයන් හඳුනාගෙන එම තොරතුරු මූලාශ්‍රයන්ගේ ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු (ග්‍රන්ථය හඳුනා ගැනීමට භාවිත කරනු ලබන තොරතුරු - ISBD ප්‍රමිතිය) ඇතුළත් කොට උපයෝජකයින්ගේ තොරතුරු අවශ්‍යතා සපුරාලීම සඳහා මුද්‍රිත හා වෙනත් ස්වරූපයකින් අඛණ්ඩ ව ප්‍රකාශයට පත් කිරීම ජාතික ග්‍රන්ථ විඥාපන පාලනය ලෙස පෙන්වා දිය හැකිය.

මෙලෙස සියලු ම රටවල විවිධාකාරයෙන් සාර්ථක ව ජාතික ග්‍රන්ථ විඥාපන පාලනය සිදු වන්නේ නම් විශ්ව හෙවත් ජාත්‍යන්තර ග්‍රන්ථ විඥාපන පාලනය සාර්ථක ව ඉටු වනු ඇත. එනම් ලෝකයේ සියලු ම රටවල විවිධ ස්වරූපයන්ගෙන් ප්‍රකාශයට පත් වන සියලු ම තොරතුරු මූලාශ්‍රයන්ගේ ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු වාර්තාගත කොට අඛණ්ඩව පවත්වා ගෙනයාම විශ්ව ග්‍රන්ථ විඥාපන පාලනයයි. විශ්ව ග්‍රන්ථ විඥාපන පාලනය ඇති කිරීමට කිහිප ආකාරයකින් දැරුවද එය වර්තමානය වනවිටත් තවදුරටත් සංකල්පයක් පමණක් වී ඇත.

ග්‍රන්ථ විඥාපන පාලනයට යටත් වන්නා වූ ප්‍රධාන ක්‍රියාවලි 6කි. (රොනල්ඩ් හග්ලර්, 1997)

ISBN 978- 955-4563- 71- 1

- සියලු ම වර්ගවල තොරතුරු සම්පත් හඳුනා ගැනීම.
- එම තොරතුරු සම්පත්වල අඩංගු කරුණු හඳුනා ගැනීම.
- මෙම තොරතුරු සම්පත් ක්‍රමානුකූලව පුස්තකාල හා ලේඛනාගාර තුළ එක් රැස් කිරීම.
- පිළිගත් නීති රීති අනුව එම තොරතුරු සම්පත් පිළිබඳ ලැයිස්තු සකස් කිරීම.
- මෙම තොරතුරු සම්පත් සඳහා ග්‍රන්ථ නාමය, විෂය හා අනෙකුත් ප්‍රයෝජනවත් ප්‍රවේශනයන් ලබාදීම.
- මෙම තොරතුරු සම්පත්වල හෝ ඒවායෙහි පිටපත් සොයාගත හැකි මාර්ග සපයා දීම.

මෙම කාර්යය භාරයන් රටක අනෙකුත් පුස්තකාලයන්ට ඉටු කළ නොහැකි අතර ජාතික පුස්තකාලයක් පිහිටු වනුයේ ඉහත වු කාර්ය භාරයන් ඉටු කිරීමේ වගකීම පවරමිනි. මේ නිසා ජාතික පුස්තකාලය මූලික වශයෙන් රටක ජාතික ග්‍රන්ථ විඥාපන පාලනයට අවශ්‍ය සියලු කටයුතු සිදු කළ යුතුය. ජාතික වශයෙන් ජාතික පුස්තකාලයට ලැබෙන්නා වූ නීතිමය තැන්පතු එකතුව, ප්‍රමිති ග්‍රන්ථ අංක ව්‍යාපෘතිය යටතේ ලැබෙන්නා වූ ග්‍රන්ථ, පරිත්‍යාග මෙන් ම දේශිය හා විදේශිය වශයෙන් රැස් කරගන්නා වූ සාහිත්‍ය පදනම් කොට ගෙන ජාතික පුස්තකාලයකට ජාතික විඥාපන ලැයිස්තු සකස් කිරීමට අවස්ථාව උදා වන්නේය. මෙලෙස සෑම රටක ම ජාතික පුස්තකාලය විධිමත් ව ජාතික ග්‍රන්ථ විඥාපන පාලනය සිදු කරන්නේ නම් විශ්ව ග්‍රන්ථ විඥාපන පාලනය එතරම් භාරදූර්ය කාර්ය භාරයක් නොවනු ඇත.

**7. නීතිමය තැන්පතු පුස්තකාලය ලෙස කටයුතු කිරීම.**

ජාතික පුස්තකාලයකට ග්‍රන්ථ ප්‍රතිග්‍රහණය කරගනු ලබන ප්‍රධාන ක්‍රමවේදයක් ලෙස නීතිමය තැන්පතු ක්‍රමය සැලකිය හැකිය. ඕනෑම රටක විවිධ වූ මුද්‍රණකරුවන්ගේ ආඥා පනත්වලට අනුව යම්කිසි පිටපත් ප්‍රමාණයක් සෑම ප්‍රකාශකයෙකු, කතුවරයෙකු විසින් ම ජාතික පුස්තකාලයට සපයනු ලබයි. නීතිමය අවශ්‍යතාවයක දී ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය පිටපත තබා ගනුයේ ජාතික පුස්තකාලයේය. මෙය ජාතික පුස්තකාලයේ ප්‍රධාන කර්තව්‍යයන් අතරට ගිණිය හැකි කාර්ය භාරයක් ලෙස සැලකිය හැකිය.

ශ්‍රී ලංකාවේ නීතිමය තැන්පතු නීතිය යටතේ ශ්‍රී ලංකාවේ ප්‍රකාශයට පත් වන්නා වූ සියලු ම ප්‍රකාශනවලින් පිටපත් 5ක් ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවට ලබා දෙනු ලබයි. මෙම පිටපත් 5න් එක් පිටපතක් 1976 සිට ජාතික පුස්තකාලයට ලැබෙන අතර මෙය නීතිමය තැන්පතු පිටපත ලෙස සලකනු නොලැබේ.

**8. පුස්තකාල වෘත්තිකයන්ට සහ අනෙකුත් වෘත්තිකයන්ට පුස්තකාල අධ්‍යාපන වැඩසටහන් සහ පුහුණු වැඩසටහන් සංවිධානය හා අඛණ්ඩ ව පවත්වා ගෙන යාම.**

ලොව සියලු ද රටවල පිහිටුවා ලනු ලැබූ ජාතික පුස්තකාලයක මූලික ඉලක්ක සහ පරමාර්ථ අතරට ගැණෙන තවත් සුවිශේෂි කාර්ය භාරයක් වනුයේ පුස්තකාල කාර්ය මණ්ඩලය පුහුණු කිරීම මෙන් ම ක්ෂේත්‍රයේ මානව සම්පත් පුහුණු කිරීම, දැනුවත් කිරීම හා ඔවුන්ගේ කුසලතා, හැකියාවන් සහ ආකල්ප මෙන් ම චර්යාවන් වැඩි දියුණු කිරීමට දායක වීමයි. සමස්ථ ජාතික පුස්තකාල පද්ධතියේ ම නායකයා වන ජාතික පුස්තකාලය පුස්තකාල ක්ෂේත්‍රය තුළ මූලික වශයෙන් දැනුම ප්‍රචාරය කරන, ව්‍යාප්ත කරන දැනුම් ප්‍රවාහය බවට පත් වී කටයුතු කළ යුතු වේ. පුස්තකාල වෘත්තිය නගා සිටුවීමේ අරමුණින් ජාතික පුස්තකාලයක් විවිධ වූ කාර්ය භාරයන් ඉටු කරනු ලබයි.

- විවිධ වූ ක්ෂේත්‍රවල පුහුණු අවශ්‍යතා හඳුනා ගැනීම.
- පුස්තකාලයාධිපතීන් ඇතුළු ව අනෙකුත් සෙසු පුස්තකාල කාර්ය මණ්ඩලය සඳහා පුහුණු පාඨමාලා, වැඩමුළු, සම්මන්ත්‍රණ සංවිධානය හා අඛණ්ඩ ව පවත්වා ගෙන යාම.
- පුස්තකාල සේවා පවත්වා ගෙන යනු ලබන ආයතන ප්‍රධානීන් විවිධ වූ සම්මන්ත්‍රණ, වැඩසටහන් මඟින් දැනුවත් කිරීම.
- රට තුළ පුස්තකාල විද්‍යා අධ්‍යාපන කටයුතු අධීක්ෂණය හා සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.
- පුස්තකාල ක්ෂේත්‍රයට සම්බන්ධ නොවන එහෙත් පුස්තකාල විෂය ක්ෂේත්‍රය කෙරෙහි ඇල්මක් දක්වන්නා වූ වෙනත් වෘත්තිකයන් දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම හා අඛණ්ඩ ව පවත්වා ගෙන යාම.
- පුස්තකාලයන්ට නව තාක්ෂණය හඳුන්වා දීමේ ප්‍රමුඛයා ලෙස කටයුතු කිරීමට ඉදිරිපත් වීම.

මෙලෙස භාර්ය දූර්ය කාර්ය භාරයක් ජාතික පුස්තකාලය මඟින් ඉටු කළ යුතු වේ.

**ISBN 978- 955-4563- 71- 1**

**9. නව තොරතුරු තාක්ෂණය මෙන් ම නව පුස්තකාල තාක්ෂණික ක්‍රම හඳුන්වා දීමේ, බෙදා හැරීමේ, නිපදවීමේ මධ්‍යගත ආයතනය ලෙස ක්‍රියා කිරීම.**

ජාතික වශයෙන් සෑම පුස්තකාලයකම කටයුතු නිසි ලෙස පවත්වා ගෙන යාමටත්, සියලු ම පාඨකයින්ට තම අවශ්‍යතාවයන්ට අනුකූල වන පරිදි තොරතුරු පහසුවෙන් හා කඩිනමින් ගවේෂණය කිරීමටත් හැකිවන ලෙස විවිධ තාක්ෂණික ක්‍රම භාවිත කිරීමට හැකියාව ඇත. පුස්තකාලයන් මෙම නව තාක්ෂණය හඳුන්වා දීම සහ ඒවා විධිමත් ව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය උපදේශන සේවා සැපයීම, පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා තාක්ෂණය විධිමත් ව හැසිරවීම යනා දී කාර්යයන් ඉටු කිරීම ජාතික පුස්තකාලයක ප්‍රධාන කාර්ය භාරයන් අතරට ගැණෙන්නකි.

එපමණක් නොව ජාතික මට්ටමෙන් ක්‍රියාත්මක වන්නා වූ මෙන් ම අන්තර් ජාතික මට්ටමෙන් ක්‍රියාත්මක වන්නා වූ පුස්තකාල ජාල සමඟ සම්බන්ධතා පැවැත්වීම සහ පුස්තකාල ජාල මඟින් ක්‍රියාත්මක කරන්නා වූ පුහුණු පාඨමාලා, වැඩමුළු, රැස්වීම්, සම්මන්ත්‍රණවලට සම්බන්ධ වෙමින් එම තොරතුරු අනෙකුත් ජාතික පුස්තකාල අතර හුවමාරු කර ගනිමින් ජාලයන්ට සම්බන්ධ මධ්‍ය ආයතනය ලෙස කටයුතු කිරීමට ජාතික පුස්තකාලය සමත් විය යුතුය. මෙහි දී පුස්තකාලයට අදාළ ව විවිධ තාක්ෂණික ක්‍රම නිපදවීමේ හැකියාව ද ජාතික පුස්තකාලක් සතුවීම ඉතා වැදගත් වේ.

**10. පර්යේෂණ කාර්යයන් සංවර්ධනය සඳහා අවශ්‍ය සහය ලබාදීම.**

ජාතික පුස්තකාලය යනු සමස්ථ රටෙහි පුස්තකාල ක්ෂේත්‍රය සම්බන්ධයෙන් වගකීම් උසුලන ප්‍රධාන ආයතනය වේ. රටක පවතින පාසල්, මහජන, විශ්වවිද්‍යාල, කොලිජ් හා විශේෂ (දෙපාර්තමේන්තු, ආයතනික පුස්තකාල යනා දී) පුස්තකාලයන්ගේ කාර්ය භාරයන් හා කටයුතු මැනීමේ වගකීම ඇත්තේ ජාතික පුස්තකාලයටයි. මූලික වශයෙන් එකී පුස්තකාලයන්හි ප්‍රධාන වශයෙන් විශ්වවිද්‍යාල හා විශේෂ පුස්තකාලවල මහා පරිමාණයෙන් සිදු කරන්නා වූ පර්යේෂණයන්ට අදාළ ව සහය සැපයීම, උපදෙස් සැපයීම සිදු කළ යුතුය. එමෙන් ම විශේෂ, විශ්වවිද්‍යාල, පාසල් හා මහජන පුස්තකාලයන්හි කාර්ය භාරයන් හා තත්ත්වය පිළිබඳ සමීක්ෂණ පවත්වමින්, සමීක්ෂණ වාර්තා තොරතුරු සංග්‍රහ ලෙස පළ කිරීම ජාතික පුස්තකාලයේ කාර්ය භාරයකි. මෙම සංඛ්‍යා ලේඛන වාර්තා, තොරතුරු සංග්‍රහ අඛණ්ඩ ව පවත්වා ගෙන යාම විවිධ ක්ෂේත්‍රවල පර්යේෂකයින්ට කරන්නා වූ මහත් පිටිවහලක් වේ. එසේ ම පුස්තකාල විද්‍යා ක්ෂේත්‍රයට අදාළ කටයුතු හා සේවාවන් සම්බන්ධයෙන් පර්යේෂණ පැවැත්වීම ද එකී පර්යේෂණ අනෙකුත් පුස්තකාලයන් වෙත පැවරීමේ දී නායකත්වය ගෙන කටයුතු කිරීම ද ජාතික පුස්තකාලයක ප්‍රධාන කර්තව්‍යයකි.

තව ද පුස්තකාල ක්ෂේත්‍රය තුළ පමණක් නොව අනෙකුත් ක්ෂේත්‍රයන්ට සම්බන්ධ වෙමින් පර්යේෂණ පවත්වන්නා වූ විද්වතුන් සඳහා විවිධ ව්‍යාපෘති යටතේ මූල්‍යාධාර සැපයීම ජාතික පුස්තකාලයේ තවත් කර්තව්‍යයකි. එසේ ම නවක පර්යේෂකයින් සඳහා අවශ්‍ය වන්නා වූ න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුම ලබා දීම සඳහා වැඩමුළු, සම්මන්ත්‍රණ සංවිධානය කිරීම, විධිමත් ව අඛණ්ඩ ව පවත්වා ගෙන යාම ජාතික පුස්තකාලය මඟින් ඉටු විය යුතු ප්‍රධාන කර්තව්‍යයන් අතරට යන්නකි.

මෙපරිද්දෙන් ජාතික පුස්තකාලයක් 21 වන සියවසට අදාළ ව කාර්ය භාරයන් විධිමත් ව ඉටු කළ යුතු ව ඇත. ඉහත දක්වන ලද කාර්යයන් අඩු වැඩි වශයෙන් සියලු ම රටවල ජාතික පුස්තකාල ඉටු කරනු ලබන අතර එසේ නොවී විධිමත් ව එම කාර්ය භාරයන් මැනවින් ඉටු කිරීම ඉතා යෝග්‍ය වේ. මේ නිසා ඉහත දක්වන ලද කාර්යයන් 21 වන සියවසට අදාළ ව ජාතික පුස්තකාලයක් ඉටු කරන්නේ නම් එය සමස්ථ පුස්තකාල පද්ධතියට ම මහත් පිටුවහලක් වනු නොඅනුමානය.

## විමර්ශන


Chandler, George (1982), ***International & national library & information services: a review of some recent developments***, vol.2, Pergaman press, Oxford.

Esdaile, Arundell (1957), ***National libraries of the world: their history, administration and public servies***, The Library Association, London.

Mangla, P.B. & Mandal, Sudhendu (edi.) (2006), ***The national library, India: an intellectual resource (NACONAL 2006),*** The National Library, Kalkata.

Penna, C.V., Foskett, D.J. & Sewell, P.H. (edi.)(1977), ***National library and information services: a handbook for planners***, Butterworths, London.

Weerasinghe, M.K. (2014), The National libraries and their problems, ***Kritavedi***: ***festschrift for senior Professor Piyadasa Ranasinghe,*** Ragama, Prof. Piyadasa Ranasighe Foundation, 388-392p.

Weerasinghe, W.k.M.M.K. (2012), ***A specific and functional model for the National library of Sri Lanka: a comparative study of the collaborative and leadership role of some National libraries in Europe, South Asia & the National library of Sri Lanka***, Unpublished thesis (Ph.D.), University of Kelaniya, Sri lanka.

ගුණසේකර, ධනපාල (1998), ***පුස්තකාල සේවාවේ මූලිකාංග,*** ගොඩගේ, කොළඹ.

ජයතිස්ස, එල්. ඒ. (1999), ***පුස්තකාල කළමනාකරණය***, කර්තෘ, කැලණිය.

ජයතිස්ස, එල්. ඒ. (2014), ***ඉලෙක්ට්‍රොනික යුගයේ පුස්තකාල කළමනාකරණය***, ගොඩගේ, කොළඹ.

මාගම්මන, ප්‍රේමචන්ද්‍ර (2002), ***විශ්ව දැනුමට මඟ පෙන්වන පුස්තකාල අත්පොත,*** ගුණසේන, කොළඹ.